WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2015

# 33 - ඉතිහාසය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# උත්තරපත්‍ර ලකුණු කිරීම - පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතු වේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

- ❖ උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
- ❖ සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී **පැහැදිලි ඉලක්කමින්** ලියන්න.
- ❖ ඉලක්කම් ලිවීමේ දී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලි ව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

**බහුවරණ උත්තරපත්‍ර (කවුළු පත්‍රය**

ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදි ව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන/අතිරේක ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

අනතුරු ව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එක ම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවක දී පැහැදිලි ව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදි ව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර ✕ ලකුණකින් ද වරණ තීරය අවසානයේ ලකුණු කරන්න. නිවැරදි ලකුණු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරය පහළින් ලියා දක්වන්න. අනතුරු ව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවල දී පරිවර්තිත ලකුණු ලියා ඒ වටා රවුමක් අඳින්න.

උදා : $\frac{60}{100}$ $\frac{20}{30}$

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර**

WWW.OLEVELAPI.COM

- ❖ අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස් ව තබා ඇති කොටස් පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.
- ❖ ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

කිසියම් අයදුම්කරුවකු විෂයයට නියමිත ප්‍රශ්නපත්‍ර එකකට පමණක් පෙනී සිටි අවස්ථාවක දී (ප්‍රශ්නපත්‍ර තුනක් ඇති විෂයයන් හි එකකට හෝ දෙකකට) ඉතිරි ප්‍රශ්නපත්‍රයට හෝ ප්‍රශ්න පත්‍රවලට ඔහු නොපැමිණි බව විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන්ව තිබේ නම්, නොපැමිණි පත්‍රවලට අයදුම්කරු ලබා ඇති ලකුණු 00 ක් සේ සලකා එම අයදුම්කරුගේ අවසාන ලකුණු තීරණය කළ යුතු ය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM

උදාහරණ : මුළු ලකුණු 100

| අවසාන ලකුණු 100 | මුළු ලකුණු 100 | I පත්‍රය 40 | II පත්‍රය 60 |
|---|---|---|---|
| 44 | 44 | AB | 44 |

| අවසාන ලකුණු 100 | මුළු ලකුණු 200 | I පත්‍රය 100 | II පත්‍රය 100 |
|---|---|---|---|
| 31 | 62 | 62 | AB |

**අවසාන ලකුණු තීරණය කළ නොහැකි අවස්ථා**

- කිසියම් විභාග මධ්‍යස්ථානයකට අයත් ඔබ ලකුණු කරන විෂයයේ I හෝ II උත්තරපත්‍ර පැකැට්ටුවලින් එක් පැකැට්ටුවක් ඔබ මණ්ඩලය වෙත ලැබී නොමැති නම් අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

  (උදා - ගණිතය විෂයය සඳහා ගණිතය I හා II වශයෙන් ප්‍රශ්න පත්‍ර දෙකක් තිබේ. එහෙත් අංක 10 දරන විභාග මධ්‍යස්ථානයෙන් ඔබ මණ්ඩලය වෙත ලැබී ඇත්තේ ගණිතය II උත්තර පත්‍ර පැකට්ටුව පමණි.)

- කිසියම් අයදුම්කරුවකුගේ I හෝ II හෝ III හෝ උත්තරපත්‍රවලින් 01 ක් හෝ 02 ක් හෝ පැකැට්ටුව තුළ නොමැති අවස්ථාවක දී, ඔහු එම ප්‍රශ්න පත්‍රයට හෝ පත්‍රවලට නොපැමිණි බව ශාලාධිපති විසින් විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන් කර නොමැති අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

- කිසියම් අයදුම්කරුවකුගේ උත්තරපත්‍රයේ සඳහන් විභාග අංකය හා ලකුණු ලැයිස්තුවේ සඳහන් විභාග අංකය නොසැසඳෙන අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

- කිසියම් මධ්‍යස්ථානයක සියලු ම අයදුම්කරුවන්ට පොදු වශයෙන් බලපා ඇති වරදක් සිදු වී ඇති අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

  උදා - ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන, කඩදාසි දෙකකින් හෝ කිහිපයකින් සමන්විත ප්‍රශ්න පත්‍රයක් ඇති අවස්ථාවක විභාග අපේක්ෂකයින්ට එක් කඩදාසියක් හෝ කිහිපයක් අඩුවෙන් දී ඇති අවස්ථා

**මෙවැනි අවස්ථාවල දී**

අවසාන ලකුණු තීරණය නොකර ලකුණු ලැයිස්තුවේ වෙනත් කරුණු තීරයේ අයදුම්කරුගේ විභාග අංකය ලියා **"අවසාන ලකුණු තීරණය කළ නොහැක"** යන සටහන යොදන්න. මෙම සටහන උත්තරපත්‍රයේ මුල් පිටුවේ පහළ කෙළවරේ ද යොදන්න. මේ පිළිබඳ ව ජර්නල් සටහනක් යොදන්න.

මෙවැනි අයදුම්කරුවන් පිළිබඳ මධ්‍යස්ථාන අනුව වෙන් වශයෙන් (9IML) අසම්පූර්ණ ලකුණු ලැයිස්තු පිළියෙල කරන්න.

WWW.OLEVELAPI.COM

මෙම ලකුණු ලැයිස්තු 9IML කවරය තුළ බහා ඇගයීම් මධ්‍යස්ථාන පරිපාලකට භාර දෙන්න.

එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**ප්‍රශ්න අංක 03 -** (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු වේ. සියල්ල ම ලකුණු කොට ලකුණු මුල් පිටුවේ සටහන්කර අවසානයේ දී ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනි ව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

පරීක්ෂාකාරී ව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකට ම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ගණන ඔබ විසින් මුල් පිටුවේ එකතු කර ඇති මුළු ගණනට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න. ඒ ඒ ප්‍රශ්න පත්‍රයට ලබා ඇති ලකුණු ප්‍රතිශතයක් වශයෙන් දැක්විය යුතු අවස්ථාවල දී එසේ දක්වන්න.
(ඇතැම් ප්‍රශ්න පත්‍රවලට නියමිත ලකුණු ගණන හා ප්‍රතිශතය සමාන වන අතර, ඇතැම් ඒවායේ නියමිත ලකුණු හා ප්‍රතිශතය වෙනස් වේ.)

### අවසාන ලකුණු තීරණය කිරීම

දින පැකැට්ටුවට අදාළ සියලු ම උත්තරපත්‍ර එනම් I හා II (ඇත්නම් III) උත්තර පත්‍ර ලකුණු කර අවසාන වූ පසු එම උත්තරපත්‍රවලට අදාළ ලකුණු අයදුම්කරුගේ II පත්‍රයේ මුල් පිටුවේ සටහන් කරන්න.

උදාහරණ :

| (අ) | | (ආ) | | (ඉ) | |
|---|---|---|---|---|---|
| (i) | $\frac{54}{100}$ | (i) | $\frac{22}{40}$ | (i) | $\frac{60.5}{100}$ |
| (ii) | $\frac{67}{100}$ | (i) | $\frac{34}{60}$ | (i) | $\frac{81}{100}$ |
| (iii) | $\frac{36}{100}$ | | | | |
| 3 | $\underline{\lfloor 157}$ | | | 2 | $\underline{\lfloor 141.5}$ |
| | 52.33 | | | | 70.75 |
| | 52% | | 56% | | 71% |

ඉහත උදාහරණවලින් දැක්වෙන පරිදි දශම සංඛ්‍යා ලැබෙන අවස්ථාවල දී අවසාන ලකුණු පමණක් පූර්ණ සංඛ්‍යාවක් ලෙස දක්වන්න. අවසාන ලකුණු ප්‍රතිශතයක් වශයෙන් පූර්ණ සංඛ්‍යාවක් ලෙස දැක්වීමේ දී ඉතිරිය 0.5 හෝ ඊට වැඩි නම් ඊළඟ පූර්ණ සංඛ්‍යාවට පැමිණවිය යුතු ය. ඉතිරිය 0.5ට අඩුනම් නොසලකා හැරිය යුතු ය. අවසාන ලකුණු ලෙස සැලකෙන්නේ එක් එක් අයදුම්කරුවන් එම විෂයයේ සෑම ප්‍රශ්න පත්‍රයකට ම ලබා ඇති ලකුණුවල ප්‍රතිශතයයි. අවසාන ලකුණු II පත්‍රය මත අකුරින් ද ලියා දක්වන්න.



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2015

## 33 - ඉතිහාසය

I පත්‍රය - ලකුණු 2 x 40 = ලකුණු 80

II පත්‍රය -

I කොටස

ප්‍රශ්න අංක 1 (අනිවාර්ය ප්‍රශ්නයකි.)

| | | | | |
|---|---|---|---|---|
| (අ) කොටස | - | ලකුණු | 18 | ලකුණු 30 |
| (ආ) කොටස | - | ලකුණු | 12 | |

II කොටස

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රශ්න අංක 2 | - | ලකුණු | 18 | (ඕනෑම ප්‍රශ්න 3කට) |
| ප්‍රශ්න අංක 3 | - | ලකුණු | 18 | 3 x 18 = ලකුණු 54 |
| ප්‍රශ්න අංක 4 | - | ලකුණු | 18 | |
| ප්‍රශ්න අංක 5 | - | ලකුණු | 18 | |
| ප්‍රශ්න අංක 6 | - | ලකුණු | 18 | |

III කොටස

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රශ්න අංක 7 | - | ලකුණු | 18 | (ඕනෑම ප්‍රශ්න 2කට) |
| ප්‍රශ්න අංක 8 | - | ලකුණු | 18 | 2 x 18 = ලකුණු 36 |
| ප්‍රශ්න අංක 9 | - | ලකුණු | 18 | |
| ප්‍රශ්න අංක 10 | - | ලකුණු | 18 | |

WWW.OLEVELAPI.COM

ලකුණු 120

අවසාන ලකුණු ගණනය කිරීම

| | | |
|---|---|---|
| I පත්‍රයට ලකුණු | = | 80 |
| II පත්‍රයට ලකුණු | = | 120 |
| එකතුව | = | 200 |
| අවසාන ලකුණු | = | 200 ÷ 2 |
| | = | 100 |



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**33 | S | I**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்**
**General Certificate of Education (Ord. Level) Examination, December 2015**

| | |
|---|---|
| **ඉතිහාසය I** | **පැය එකයි** |
| வரலாறு I | ஒரு மணித்தியாலம் |
| History I | *One hour* |

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු **80** ක් හිමි වේ.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** රටක වර්තමානය හා අනාගතය අනිවාර්යයෙන් ම එහි අතීතය මත ගොඩනැගෙන බව ප්‍රකාශ කළේ,
(1) සර් වින්ස්ටන් චර්චිල් ය.
(2) ඊ. එච්. කාර් ය.
(3) ශ්‍රී ජවහර්ලාල් නේරු ය.
(4) ඒබ්‍රහම් ලින්කන් ය.

**2.** ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය ගැන තොරතුරු සොයන්නකුට වැදගත් වන මූලාශ්‍රය මින් කුමක් ද?
(1) අභිලේඛන (2) ජනකතා (3) ගුහා චිත්‍ර (4) ගල් මෙවලම්

**3.** ශ්‍රී ලංකාවේ ශාසනික ඉතිහාසය හැදෑරීමේ දී වැදගත් වන සාහිත්‍යයික මූලාශ්‍රයකි,
(1) රාජාවලිය
(2) නිකාය සංග්‍රහය
(3) ධර්ම ප්‍රදීපිකාව
(4) සද්ධර්මරත්නාවලිය

**4.** අපේ පුරාවස්තු රැකගැනීම වඩාත් වැදගත් වන්නේ, ඒවා,
(1) අතීතයට අයත් දේවල් නිසා ය.
(2) මිල කළ නොහැකි දේවල් නිසා ය.
(3) දේශීය උරුමය ප්‍රදර්ශනය කිරීමට හේතු වන නිසා ය.
(4) විදේශ සංචාරකයන්ට පෙන්විය හැකි නිසා ය.

**5.** ක්‍රි. ව. පස්වැනි සියවසේ දී අනුරාධපුර රාජකීය කාන්තාවන්ගේ ඇඳුම්-පැළඳුම් ගැන අවබෝධයක් ලබා ගත හැකි මූලාශ්‍රයකට නිදසුනක් වන්නේ,
(1) සීගිරි චිත්‍ර ය.
(2) තිවංක පිළිමගෙයි චිත්‍ර ය.
(3) දෙගල්දොරුව විහාර චිත්‍ර ය.
(4) කැලණි විහාර චිත්‍ර ය.

**6.** බුදු දහම මෙරට ව්‍යාප්ත වූ අනුරාධපුර මුල් යුගයේ දී බහුල ව දක්නට ලැබෙන්නේ,
(1) වැම් ලිපි ය. (2) ලෙන් ලිපි ය. (3) පර්වත ලිපි ය. (4) පුවරු ලිපි ය.

**7.** ශ්‍රී ලංකාව ගැන තොරතුරු දැක් වූ විදේශීය ලේඛකයන්ගේ වැඩි අවධානය යොමු වී ඇත්තේ,
(1) මෙරට පැවැති වෙළඳාම ගැන ය.
(2) මෙහි ව්‍යාප්ත ව තිබූ ආගම් ගැන ය.
(3) අනුරාධපුර පාලනය ගෙන ගිය පාලකයන් ගැන ය.
(4) වරින්වර මෙරටට එල්ල වූ ආක්‍රමණ ගැන ය.

**8.** පැරණි ශ්‍රී ලාංකිකයන් වාරි කටයුතු සඳහා බහුල ව යොදා ගත් මහවැලි ගඟට සම්බන්ධ **නො වන** වාරි නිර්මාණය කුමක් ද?
(1) ඇළහැර ඇළ (2) අංගමැඩිල්ල ඇළ (3) රිදීබැඳි ඇළ (4) මිණිපේ ඇළ

**9.** යෝධ ඇළ හෙවත් ජය ගඟ විශිෂ්ට වාරි නිර්මාණයක් ලෙස සැලකීමට හේතුව මින් කුමක් ද?
(1) ඇළ පතුලේ ඇති සියුම් බෑස්ම
(2) ඇළ මඟින් දිගු දුරකට ජලය ගෙන යාම
(3) කලා වැව හා තිසා වැව සම්බන්ධ කිරීම
(4) කුඩා වැව් රාශියක් පෝෂණය කිරීම

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

10. පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම්, ඒවා සිදු වූ අනුපිළිවෙළ අනුව දැක් වූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

A - ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම

B - කාලිංග-මාඝ පොළොන්නරුව ආක්‍රමණය කිරීම

C - ශ්‍රී මහා බෝධි රෝපණය

D - සීගිරි බලකොටුව ඉදිකිරීම

(1) C, A, D හා B (2) C, B, A හා D (3) C, D, A හා B (4) C, D, B හා A

11. අනුරාධපුර යුගයේ මුල් භාගයේ දී ඉන්දු-ලංකා සබඳතාවල කැපී පෙනෙන ලක්ෂණය වී ඇත්තේ,

(1) වෙළෙඳ දූත හුවමාරුවයි. (2) යුද ආධාර ලබා ගැනීමයි.
(3) ආක්‍රමණයි. (4) සංක්‍රමණයි.

12. අනුරාධපුර යුගයේ ඉදිකරන ලද ප්‍රථම ස්තූපය වන්නේ,

(1) රත්නමාලී චෛත්‍යයයි. (2) ථූපාරාම චෛත්‍යයයි.
(3) තිස්සමහාරාම චෛත්‍යයයි. (4) මහියංගන චෛත්‍යයයි.

13. යාපනය රාජධානියේ ප්‍රධාන හින්දු ආගමික මධ්‍යස්ථානය මෙන් ම අගනුවර ද වී ඇත්තේ,

(1) වල්ලිපුරම් ය. (2) චාවාකච්චේරි ය. (3) කන්දරෝඩෙයි ය. (4) නල්ලූර් ය.

14. අනුරාධපුරයේ රත්මසු උයනට හා කුට්ටම් පොකුණට භූගත නළ මාර්ග මගින් ජලය ගෙන යන ලද බව තහවුරු වී ඇත්තේ මින් කවර වැවක සිට ද?

(1) බසවක්කුලම වැව (2) තිසා වැව (3) නුවර වැව (4) නාච්චදූව වැව

15. 'පටුන්ගම්' යනු,

(1) වෙළෙඳ නගර ආශ්‍රිත ජනාවාසයි. (2) විවිධ කර්මාන්ත සඳහා ප්‍රසිද්ධ වූ ජනාවාසයි.
(3) කුඩා වැව් ආශ්‍රිත ව පිහිටි ජනාවාසයි. (4) ගංගා මුව දොර පිහිටි තොටුපොළ ආශ්‍රිත ජනාවාසයි.

16. පළමුවැනි විජයබාහු රජතුමා පොළොන්නරු යුගයේ එක් ශ්‍රේෂ්ඨ පාලකයකු ලෙස සැලකීමට පදනම් වන ප්‍රමුඛ හේතුව මින් කුමක් ද?

(1) ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම (2) විදේශ ආධිපත්‍යයෙන් රට නිදහස් කර ගැනීම
(3) කෘෂිකර්මය නගා සිටුවීමට කටයුතු කිරීම (4) අසල්වැසි රටවල් සමඟ මිත්‍රශීලීව කටයුතු කිරීම

17.
- කෝට්ටේ බලකොටුවක් නිර්මාණය කිරීම
- ගම්පොළ තුන්වැනි වික්‍රමබාහු රජුගේ අගමැති ලෙස රාජ්‍ය කටයුතු මෙහෙය වීම
- යාපනයේ ආර්ය චක්‍රවර්ති රජුගේ බදු නිලධාරීන්ට එරෙහි ව කටයුතු කිරීම

ඉහත සඳහන් ඓතිහාසික සිදුවීම් හා සම්බන්ධ පුද්ගලයා වූයේ,

(1) සපුමල් කුමරු ය. (2) අම්බුළුගල කුමරු ය.
(3) සේනාලංකාධිකාර සෙනෙවි ය. (4) නිශ්ශංක අලගක්කෝණාර ය.

18. පෘතුගීසීන් පෙරදිග ජාතියක් අතින් දරුණුතම පරාජය ලැබුයේ මින් කුමන සටනකින් ද?

(1) දන්තුරේ (2) මුල්ලේරියාව (3) රන්දෙනිවෙල (4) ගන්නෝරුව

19. ලන්දේසි පාලනය නිසා මෙරට ඇති වූ ප්‍රතිඵල **දෙකක්** ඇතුළත් පිළිතුර තෝරන්න.

A - කුරුඳු, වතු වගාවක් ලෙස සංවිධානය කිරීම

B - භාණ්ඩ ප්‍රවාහනයට ඇළ මාර්ග යොදා ගැනීම

C - බයිලා - කපිරිඤ්ඤා සංගීතය ජනප්‍රිය වීම

D - රෝමානු කතෝලික ආගම පැතිරවීම

(1) A හා B (2) B හා C (3) B හා D (4) C හා D

20. නව පෙළපතක් ආරම්භ කොට මහනුවර රාජධානියට ශක්තිමත් පදනමක් දමන ලද්දේ,

(1) සේනාසම්මත වික්‍රමබාහු රජු ය. (2) පළමුවැනි විමලධර්මසූරිය රජු ය.
(3) දෙවැනි රාජසිංහ රජු ය. (4) කීර්ති ශ්‍රී රාජසිංහ රජු ය.

21. ලන්දේසින් තම පෙරදිග මූලස්ථානය ලෙස තෝරාගත්තේ මින් කවර නගරයක් ද?

(1) ගෝව (2) පොන්ඩිචෙරි (3) බතාවිය (4) මද්‍රාසිය



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**22.** බ්‍රිතාන්‍යයන්ට ශ්‍රී ලංකාව යටත්කර ගැනීමේ අදහසක් ඇති වීම කෙරෙහි බලපෑ ප්‍රධානතම සාධකය මින් කුමක් ද?
(1) ත්‍රිකුණාමලය වරායේ පිහිටීම
(2) මෙරට කුරුඳුවල උසස් බව
(3) වැවිලි බෝග සඳහා ඉඩම් ලබා ගැනීම
(4) ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය කිරීම

**23.** බ්‍රිතාන්‍ය පාලන සමයේ දී 'ඇඟබද්ද' පනවන ලද ආණ්ඩුකාරයා වූයේ,
(1) ෆ්‍රෙඩ්රික් නෝර්ත් ය.
(2) තෝමස් මේට්ලන්ඩ් ය.
(3) විලියම් ග්‍රෙගරි ය.
(4) ටොරින්ටන් සාමිවරයා ය.

**24.** ව්‍යවස්ථාදායක සභාවට පළාත්බද ඡන්ද කොට්ඨාස අනුව සාමාජිකයින් තෝරා ගැනීම ආරම්භ වූයේ කවර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් යටතේ ද?
(1) කෝල්බෲක් (2) කෲෆ්-මැකලම් (3) මැනිං (4) ඩොනමෝර්

**25.** සෝල්බරි ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වීමෙන් පසු ශ්‍රී ලංකාවේ ඇති වූ වෙනස්කම මින් කුමක් ද?
(1) සර්වජන ඡන්ද බලය ලබා දීම
(2) පාර්ලිමේන්තු ක්‍රමය හඳුන්වා දීම
(3) විධායක කාරක සභා ක්‍රමය ඇරඹීම
(4) රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම

**26.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජාතික වැදගත්කමකින් යුත් කරුණක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට ඇති වඩා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය වන්නේ,
(1) ජනමාධ්‍ය තුළින් මහජන අදහස් විමසීම ය.
(2) පාර්ලිමේන්තුව තුළ දී විවාද කිරීම ය.
(3) ජනමත විචාරණයක් පැවැත්වීම ය.
(4) ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය අනුව කටයුතු කිරීම ය.

**27.** වයඹදිග ඉන්දියාව බාහිර ලෝකය සමඟ සම්බන්ධතා පැවැත්වීම කෙරෙහි බලපා ඇති ප්‍රධාන භූගෝලීය ලක්ෂණය මින් කුමක් ද?
(1) දුර්ග මාර්ග (2) කාන්තාර (3) කඳුවැටි (4) ගංගා

**28.** මගධ අධිරාජ්‍යය හා සම්බන්ධ පහත දැක්වෙන සිදුවීම් ඒවායේ ඓතිහාසික අනුපිළිවෙළ අනුව පෙළ ගැස් වූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

A – ධනනන්ද රාජ්‍ය සමයේ දී උතුරු ඉන්දියාවේ විශාල ප්‍රදේශයක මගධ රාජ්‍යය ව්‍යාප්ත වීම
B – බිම්බිසාර රජතුමා විසින් අංග රාජ්‍යය මගධයට ඈඳා ගැනීම
C – මගධ රාජ්‍යයේ අගනුවර පාටලීපුත්‍ර නගරයට මාරු කිරීම
D – මගධ රාජ්‍යයේ බලය මෞර්ය රාජ වංශයට හිමි වීම

(1) B, A, C හා D (2) B, C, A හා D (3) C, A, B හා D (4) C, B, A හා D

**29.** අශෝක හා මහා අක්බාර් යන පාලකයන් දෙදෙනාගේ ම ප්‍රතිපත්තිවල පොදු ලක්ෂණය වන්නේ,
(1) ඉන්දියාවෙන් පිටතට අධිරාජ්‍යය ව්‍යාප්ත නොකිරීම ය.
(2) ශ්‍රී ලංකාව සමඟ දේශපාලන හා සංස්කෘතික සම්බන්ධතා පැවැත්වීම ය.
(3) ආගමික සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම ය.
(4) තම බල පරාක්‍රමය පෙන්වීම සඳහා රට තුළ කුලුනු ඉදිකිරීම ය.

**30.** රුසියාවට ප්‍රථමවරට සමාජවාදය හඳුන්වා දෙන ලද පුද්ගලයා වන්නේ,
(1) ව්ලැඩිමීර් ලෙනින් ය.
(2) ලියොන් ට්‍රොට්ස්කි ය.
(3) පෙලකානොව් ය.
(4) මාර්ටෝව් ය.

W W W . O L E V E L A P I . C O M

**31.** හිට්ලර්ගේ දේශපාලන දර්ශනය වූයේ,
(1) නාසිවාදයයි. (2) ධනවාදයයි. (3) ෆැසිස්ට්වාදයයි. (4) සමාජවාදයයි.

**32.** ධනපති පංතිය හා කම්කරු පංතිය වශයෙන් සමාජ බෙදීමක් ඇති වීමට බලපෑවේ,
(1) වැඩවසම් ක්‍රමයයි. (2) පුනරුදයයි. (3) යටත් විජිතවාදයයි. (4) කාර්මික විප්ලවයයි.

**33.** සියවස් ගණනාවක් තිස්සේ ස්ථාවර ව පැවැති චීන සමාජය ශීඝ්‍රයෙන් වෙනස් වීම ආරම්භ වූයේ පහත සඳහන් කවර සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් ද?
(1) ක්වෝ මිං ටාන් පක්ෂයේ බලවත් වීම
(2) දීර්ඝ පාගමන
(3) මහා ඉදිරි පිම්ම
(4) සංස්කෘතික විප්ලවය

**34.** චීන සමූහාණ්ඩුවේ ප්‍රථම ජනාධිපතිවරයා වූයේ,
(1) සුන්-යත්-සෙන් ය.
(2) චියැං-කායි-ෂෙක් ය.
(3) යුවාං-ෂි-කායි ය.
(4) මාඕ-සේ-තුං ය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

35. ජපානයේ වැඩවසම් ක්‍රමය අහෝසි කරන ලද්දේ,
(1) නොබුනගා විසිනි. (2) හිදෙයෝෂි විසිනි.
(3) ටොකුගාවා ඉයාසු විසිනි. (4) මුට්සුහිතෝ අධිරාජයා විසිනි.

36. 'ඩයට් සභාව' මින් කවර රටක ව්‍යවස්ථාදායකය ද?
(1) චීනයේ (2) ජපානයේ (3) කොරියාවේ (4) ඊශ්‍රායලයේ

37. බටහිර යුරෝපා රටවල ආරක්ෂාව සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයේ නායකත්වයෙන් යුතුව පිහිටුවා ගත් සංවිධානය කුමක් ද?
(1) නේටෝ (2) සාර්ක් (3) නොබැඳිජාතීන් (4) වෝර්සෝ

38. පහත දැක්වෙන රහස් ඔත්තු සේවා අයත් රටවල් පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?

| | |
|---|---|
| (i) මධ්‍යම රහස් ඔත්තු සංවිධානය (CIA) | A - ඊශ්‍රායලය |
| (ii) මොසාඩ් සංවිධානය (MOSSAD) | B - සෝවියට් රුසියාව |
| (iii) K.G.B ඔත්තු සේවය | C - ජර්මනිය |
| | D - ඇමෙරිකා එක්සත් ජනපදය |

(1) A, D හා B (2) A, D හා C (3) C, B හා A (4) D, A හා B

39. මොන්ටෙස්කියු, වෝල්ටෙයර්, රූසෝ යන අයගේ අදහස් මඟින් පසුබිම සකස් වූයේ පහත සඳහන් කවර ඓතිහාසික සිද්ධියකට ද?
(1) රුසියන් විප්ලවයට (2) චීන විප්ලවයට
(3) ප්‍රංශ විප්ලවයට (4) ඇමෙරිකානු නිදහස් සටනට

40. 1948 'බැල්ෆර් ප්‍රකාශනය' මඟින් ස්ථාපිත කරනු ලැබූ නව රාජ්‍යය වූයේ,
(1) ඊශ්‍රායලයයි. (2) ක්‍රොඒෂියාවයි. (3) යුගොස්ලෝවියාවයි. (4) පලස්තීනයයි.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2015
க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2015

| විෂයය අංකය பாட இலக்கம் | 33 | විෂයය பாடம் | ඉතිහාසය |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 03 | 11. | 04 | 21. | 03 | 31. | 01 |
| 02. | 04 | 12. | 02 | 22. | 01 | 32. | 04 |
| 03. | 02 | 13. | 04 | 23. | 04 | 33. | 04 |
| 04. | 03 | 14. | 02 | 24. | 03 | 34. | 03 |
| 05. | 01 | 15. | 04 | 25. | 02 | 35. | 04 |
| 06. | 02 | 16. | 02 | 26. | 03 | 36. | 02 |
| 07. | 01 | 17. | 04 | 27. | 01 | 37. | 01 |
| 08. | 03 | 18. | 02 | 28. | 02 | 38. | 04 |
| 09. | 01 | 19. | 01 | 29. | 03 | 39. | 03 |
| 10. | 01 | 20. | 02 | 30. | 03 | 40. | 01 |

WWW.OLEVELAPI.COM

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **02** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **02 × 40 = 80**

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| | | | |
|---|---|---|---|
| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை | 25 / 40 | I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி | 50 / 80 |



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## I කොටස

1. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) යෝධ වැව, මහියංගනය, ගාල්භ නදී, මිහින්තලේ, පඬුවස්නුවර, පරාක්‍රම සමුද්‍රය, කසාතොට, ලංකා පට්ටන, යාපනය නගරය, ගොඩවාය (ලකුණු 10 යි)

(ii) සින්ධු ගඟ, මලක්කා සමුද්‍ර සන්ධිය, ගෝව, හිරෝෂිමා, රෝමය, තායිවානය, දිල්ලිය, කාම්බෝජය (ලකුණු 08 යි)

(ආ) (i) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන්/ස්ථාන අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - විජය කුමරු ඇතුළු පිරිස මෙරටට ගොඩබට ස්ථානය

*B* - වයඹදිග ඉන්දියාව ආක්‍රමණය කළ පළමු ග්‍රීක අධිරාජයා


*C* - ඉන්දියාවට නිදහස ලැබෙන විට බ්‍රිතාන්‍යයේ සිටි අගමැතිවරයා

*D* - දුරකථනය නිපද වූ ඇමෙරිකන් ජාතිකයා (ලකුණු 04 යි)

- *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **අංක අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. *A* වලින් දැක්වෙන නිර්මාණයේ නම කුමක් ද?
2. එය කරවන ලද රජතුමා නම් කරන්න.
3. ශ්‍රී ලංකාවේ කවර ඓතිහාසික නගරයක මෙය දක්නට ලැබේ ද?
4. මෙහි බිත්තිවල ආරුක්කු සහිත කුහරවල දක්නට ලැබෙන්නේ මොනවා ද?

(ලකුණු 04 යි)



*A*

(iii) 1. *B* වලින් දැක්වෙන්නේ කුමක් ද?
2. එහි වම් අත්ල මත දක්නට ලැබෙන්නේ කුමක් ද?
3. මෙවැනි නිර්මාණ බහුල ව දක්නට ලැබෙනුයේ කවර ස්ථාන ඉදිරිපිට ද?
4. මෙවැනි නිර්මාණ සඳහා බහුල ව යොදාගෙන ඇති අමුද්‍රව්‍යය කුමක් ද?

(ලකුණු 04 යි)



*B*


WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

1. (අ) (i)
1. (அ) (i)
1. (a) (i)


විභාග අංකය
சுட்டெண்
Index No. ..........................






අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

1. (අ) (ii)
1. (அ) (ii)
1. (a) (ii)






අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## II වන පත්‍රය

### I කොටස

(අ) (i) A - තම්මැන්නාව/තම්බපණ්ණි

B - මහා ඇලක්සැන්ඩර්/ඇලෙක්සැන්ඩර්

C - ක්ලේමන්ට් ඇට්ලි/ඇට්ලි

D - ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්/ග්‍රැහැම්බෙල්

(ලකුණු 01×04 = 04 යි)

(ii) 1. සත්මහල් ප්‍රාසාදය

2. නිශ්ශංකමල්ල රජ/කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජ

3. පොලොන්නරුව/පුලතිසිපුර, පුලස්තිපුර, ජනනාථ නගර,

4. දේවතා රූප/දේව රූප

(ලකුණු 01×04 = 04 යි)

(iii) 1. මුරගල/දොරටුපාල රූපය

2. පුන්කළස / පූර්ණ ඝටය

3. ආගමික ස්ථාන/පූජනීය ස්ථාන/ විහාරස්ථාන, බෞද්ධ සිද්ධස්ථාන, පිළිමගෙවල්

4. කළුගල්/හුණුගල් / හුණුගල් පාෂාණ

(ලකුණු 01×04 = 04 යි)

### II කොටස

02. නිපුණතාව :

**අනුරාධපුර යුගයේ වාරි කටයුතු, මධ්‍ය පාලනය හා පරිහානිය පිළිබඳ දැනුම අවබෝධ පිරික්සීම**

**2.** (i) *A* - කදම්බ නදී

*B* - ගෝණ නදී

*C* - කප්පකන්දර නදී

යන ගංගාවල වර්තමාන නම් වරහන් තුළින් තෝරා ලියන්න.

(කලා ඔය, දැදුරු ඔය, මල්වතු ඔය, යාන් ඔය, මැණික් ගඟ, කුඹුක්කන් ඔය)

(ii) *A* - වසභ

WWW.OLEVELAPI.COM

*B* - මහසෙන්

*C* - ධාතුසේන

*D* - දෙවැනි අග්බෝ

යන එක් එක් පාලකයා විසින් කරවන ලද වාරි කර්මාන්තය කුමක් දැයි වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් දක්වන්න.

(අභය වැව, කන්තලේ වැව, තුරුළු වැව, තිසා වැව, මහවිලච්චිය වැව, නාච්චදූව වැව, පදවිය වැව, කලා වැව)

(iii) අනුරාධපුර රාජධානිය පිරිහීයාමට හේතු වූ කරුණු **දෙකක්** විස්තර කරන්න.

(iv) ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ මධ්‍ය පාලනය සංවිධානය වූ ආකාරය පහත සඳහන් ශීර්ෂ යටතේ විස්තර කරන්න.

*A* - රජතුමා සතු කාර්යභාරය

*B* - රාජ්‍ය නිලධාරීන්



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM

(i) A - මල්වතු ඔය
B - කලා ඔය
C - මැණික් ගඟ

(ලකුණු 01×03 = 03 යි)

(ii)
A - මහවිලච්චිය වැව
B - හුරුළු වැව
C - කලා වැව
D - කන්තලේ වැව

(ලකුණු 01×04 = 04 යි)

(iii)
- දුර්වල පාලකයන් බලයට පත්වීම
- දකුණු ඉන්දීය ආක්‍රමණ (චෝළ)
- කුලී හමුදා ආක්‍රමණිකයාගේ පැත්ත ගැනීම

**කරුණු දෙකක් විස්තර කිරීමට** (ලකුණු 02+03 = 05 යි)

(iv)

A • රටවැසියන් ආරක්ෂා කිරීම (විදේශීය හා දේශීය සතුරන්ගෙන්)
- ගොවිතැන් කටයුතු සඳහා වාරි පහසුකම් සැපයීම
- ආගමික හා සංස්කෘතික කටයුතු සඳහා අනුග්‍රහය දැක්වීම
- යුක්තිය පසිඳලීම
- දසරාජ ධර්මය අනුව රට පාලනය කිරීම

B • ප්‍රධාන රාජ්‍ය නිලධාරීන් (සේනාධිපති, පුරෝහිත, බඩකරික, මහලේනා ආදීන්) කාර්යයන් විස්තර කිරීම

**ඉහත ශීර්ෂ යටතේ විස්තර කිරීමට** (ලකුණු 03+03 = 06 යි)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

03. නිපුණතාව :

**ශ්‍රී ලංකාවේ අතීත වෙළෙඳ සම්බන්ධතා හා බුදුදහමින් කලාව පෝෂණය වූ ආකාරය පිළිබඳ විමර්ශනාත්මකව විමසීමේ හැකියාව පිරික්සීම**

**3.** (i) අනුරාධපුර හා පොළොන්නරු යුගවල දී ශ්‍රී ලංකාව සමඟ වෙළෙඳ සම්බන්ධතා පැවැත් වූ රටවල් **තුනක්** නම් කරන්න.

(ii) අතීතයේ දී ශ්‍රී ලංකාවට ආනයනය කළ වෙළෙඳ ද්‍රව්‍ය **දෙකක්** ද ශ්‍රී ලංකාවෙන් අපනයනය කළ වෙළෙඳ ද්‍රව්‍ය **දෙකක්** ද වෙන් වෙන් ව ලියා දක්වන්න.

(iii) විදේශ සම්බන්ධතා වර්ධනය වීම කෙරෙහි බලපෑ ශ්‍රී ලංකාවේ පිහිටීමේ විශේෂ ලක්ෂණ **දෙකක්** පැහැදිලි කරන්න.

(iv) බුදුදහම නිසා මෙරට
*A* - ගෘහ නිර්මාණ ශිල්පය
*B* - කැටයම් හා මූර්ති කලාව
**පෝෂණය වූ ආකාරය නිදසුන් සහිත ව පෙන්වා දෙන්න.**

(i) • ඉන්දියාව, අරාබිය, පර්සියාව, ග්‍රීසිය, රෝමය, චීනය, බුරුමය

**(ලකුණු 01×03 = 03 යි)**

(ii) • ආනයන ද්‍රව්‍ය - රන්, රිදී, පබළු, වීදුරු භාණ්ඩ, පිඟන් භාණ්ඩ, අශ්වයන්, සේද

• අපනයන ද්‍රව්‍ය - අලි ඇතුන්, ඇත් දළ, මුතු මැණික්, සක්බෙල්ලන්, කැස්බෑ ලෙලි, කපුරෙදි

**(ලකුණු 02+02 = 04 යි)**

(iii) • ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම

• පෙර අපර දෙදිග වෙළඳ මාර්ගයේ කේන්ද්‍රගතව පිහිටීම

• මෝසම් සුළං/හා දියවැල් රටාව තුළ පිහිටීම

• දිවයින වටා ස්වභාවික වරායන් පිහිටීම

• ඉන්දියාවට ආසන්නව පිහිටීම

**මේවායින් දෙකක් විස්තර කිරීම සඳහා** **(ලකුණු 02+03 = 05 යි)**

(iv)

A • ගෘහ නිර්මාණ ශිල්පය

- ස්ථූප, ස්ථූපඝර, බෝධිඝර, පිළිමගෙවල්, ආරාම, පොහොය ගෙවල් නිර්මාණය



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

B ● කැටයම් හා මූර්ති කලාව

- ආගමික ගොඩනැගිලි උපාංගවල කැටයම් නිර්මාණ
- සඳකඩ පහණ, මුරගල, වාහල්කඩ කැටයම්
- බුදු පිළිම (හිටි පිළිම, ඉඳි පිළිම, සැතපෙන පිළිම)
- බෝසත් පිළිම (අවලෝකිතේශ්වර) ,

**නිදසුන් සහිතව දැක්වීමට** **(ලකුණු 03+03 = 06 යි)**

04. **නිපුණතාව :**

**ශ්‍රී ලංකාවේ භෞතික පරිසරය හා ඉතිහාසය අතර ඇති සම්බන්ධතාව පිළිබඳ දැනුමද, කෝට්ටේ යුගය දක්වා වූ ඓතිහාසික සිදුවීම් පිළිබඳ දැනුම ද පිරික්සීම**

**4.** (i) පහත සඳහන් ප්‍රදේශ හැඳින් වූ ඓතිහාසික නම් මොනවා දැයි වරහන් තුළින් තෝරා ලියන්න.

*A* - යාපනය අර්ධද්වීපය
*B* - දළ වශයෙන් වර්තමාන උතුරුමැද පළාතට අයත් වන ප්‍රදේශය
*C* - ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරය

(සබරගමුව, මලය රට, තමන්කඩුව, පිහිටි රට, නකදිව, දිගාමඩුල්ල)

(ii) පහත සඳහන් සිද්ධිවලට සම්බන්ධ පුද්ගලයන් කවුරුන් දැයි වරහන් තුළින් තෝරා ලියන්න.

*A* - පළමු පෞද්ගලික ආරාම පූජාව සිදු කිරීම
*B* - දන්ත ධාතූන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරවන අවධියේ අනුරාධපුර පාලනය කිරීම
*C* - බොහෝ ශිලා ලිපි කරවීම හා තුලාභාර දාන දීම සම්බන්ධයෙන් ප්‍රසිද්ධ වීම
*D* - සංගමු විහාර සෙල්ලිපියට අනුව පළමුවැනි පරාක්‍රමබාහු රජු සමග සම්මුතියකට එළඹීම

(වෝහාරික තිස්ස, දෙවැනි ගජබාහු, සිරිසඟබෝ, කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල, සහස්සමල්ල, වළගම්බා, කිත්සිරිමෙවන්, මානාභරණ)

(iii) පොළොන්නරුවෙන් පසුව පාලන මධ්‍යස්ථාන තෝරා ගැනීමේ දී පාලකයන්ගේ අවධානය යොමු වූ කරුණු **දෙකක්** පැහැදිලි කරන්න.

(iv) හයවැනි පරාක්‍රමබාහු රාජ්‍ය සමය දේශපාලන හා සංස්කෘතික වශයෙන් වැදගත් වන්නේ ඇයි දැයි නිදසුන් සපයමින් විස්තර කරන්න.

(i) A - නකදිව
B - පිහිටි රට
C - මලය රට

WWW.OLEVELAPI.COM

**(ලකුණු 01×03 = 03 යි)**

(ii) A - වළගම්බා
B - කිත්සිරිමෙවන්/~~කීර්ති ශ්‍රී මේඝවර්ණ~~
C - කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල
D - දෙවැනි ගජබාහු

**(ලකුණු 01×04 = 04 යි)**

(iii) ● ආරක්ෂාව
● කෘෂිකාර්මික පහසුව
● වෙළඳ කටයුතු (කුළුබඩු) සඳහා පහසු ප්‍රදේශ

**මෙවැනි කරුණු දෙකක් පැහැදිලි කිරීම සඳහා** **(ලකුණු 02+03 = 05 යි)**



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(iv) • **දේශපාලන**

- යාපනය, වන්නි ප්‍රදේශ ඈඳා ගැනීම
- මලය රටෙහි කැරැල්ල මර්දනය
- වන්නි ප්‍රදේශයේ ස්වාධීන පාලකයන් අවනත කර ගැනීම
- අවසන් වරට ඒකීය පාලනයක් ඇති කිරීම
- විජයනගර් අධිරාජ්‍යයේ තොටුපළක් ආක්‍රමණය කිරීම

• **සංස්කෘතික**

- අධ්‍යාපනයේ දියුණුව (පිරිවෙන් අධ්‍යාපනය හා පිරිවෙන්)
  උදා :- පැපිළියානේ සුනේත්‍රාදේවී පිරිවෙන
- සිංහල සංදේශ සාහිත්‍යයේ දියුණුව
  උදා :- සැලළිහිණි, ගිරා,හංස ආදී සංදේශ කාව්‍ය
- ශ්‍රේෂ්ඨ පඬිවරු බිහිවීම
  උදා :- තොටගමුවේ ශ්‍රී රාහුල, වෑත්තෑවේ හිමි
- වෙහෙර විහාර නිර්මාණය/අනුග්‍රහය
- හින්දු කෝවිල් නිර්මාණයට අනුග්‍රහය දැක්වීම

**නිදසුන් දක්වමින් විස්තර කිරීමට** **(ලකුණු 03+03 = 06 යි)**

05. නිපුණතාව :

**කෝට්ටේ යුගයේ සිට බ්‍රිතාන්‍ය පාලනය දක්වා කාලය තුළ අතිවූ දේශපාලන, ආර්ථික, සමාජ සිදුවීම් පිළිබඳ තුළනාත්මක අවබෝධය පිරික්සීම**

5. (i) විජයබා කොල්ලයෙන් පසුව ඇති වූ

*A* - කෝට්ටේ

*B* - සීතාවක

*C* - රයිගම

යන රාජධානිවල ආරම්භක පාලකයන් **තිදෙනා** නම් කරන්න.

(ii) පහත *A*, *B*, *C* හා *D* වලින් දැක්වෙන ඓතිහාසික සිද්ධීන් හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන් දැයි වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.

*A* - පෘතුගීසීන්ගේ රූකඩයක් බවට පත් වූ කෝට්ටේ පාලකයා

*B* - මුල් වතාවට පෘතුගීසීන්ට එරෙහිව දැඩි පිළිවෙතක් අනුගමනය කළ යාපනයේ පාලකයා

*C* - 'කිව් ලිපිය' අනුව ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් ඉංග්‍රීසීන්ට භාරදීමට අකමැති වූ ලන්දේසි ආණ්ඩුකාරවරයා

*D* - ක්‍රි.ව. 1815 උඩරට ගිවිසුමට අත්සන් කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා

(ජෝන් ඩොයිලි, රොබට් බ්‍රවුන්රිග්, දොන් ජුවන් ධර්මපාල, විදිය බණ්ඩාර, සංකිලි, පරරාජසේකරම්, ෆන් එංගල්බෙක්, රයික්ලෝෆ් ෆන් ගුන්ස්)

(iii) ක්‍රි.ව. 1818 දී උඩරට ප්‍රදේශවල ආරම්භ වූ බ්‍රිතාන්‍ය විරෝධී නිදහස් අරගලය අසාර්ථක වීමට හේතු වූ කරුණු **දෙකක්** පැහැදිලි කරන්න.

(iv) වතු වගාව ව්‍යාප්ත වීම නිසා ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ ක්ෂේත්‍රවල ඇති වූ වෙනස්කම් **එක** බැගින් නිදසුන් ඉදිරිපත් කරමින් විස්තර කරන්න.



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(i) A - හත්වන බුවනෙකබාහු

B - මායාදුන්නේ

C - රයිගම් බණ්ඩාර (මද්දුම බණ්ඩාර)

(ලකුණු 01×03 = 03 යි)

(ii) A - දොන් ජුවන් ධර්මපාල

B - සංකිලි

C - ෆන් එංගල්බෙක්

D - රොබට් බ්‍රවුන්රිග්

(ලකුණු 01×04 = 04 යි)

(iii)
- අසංවිධානාත්මක බව
- සටනේ නායකයන් අතර එකමුතුබවක් නොවීම
- ඇතැම් දේශීය නායකයන් බ්‍රිතාන්‍යයන්ට පක්ෂපාති වීම (මොල්ලිගොඩ)
- බ්‍රිතාන්‍යයන්ගේ කෲර මර්දනකාරී ප්‍රතිපත්තිය
- දොරේසාමි රාජ්‍ය උරුමක්කරුවකු නොවන බව හෙළිවීම
- බ්‍රිතාන්‍යයන්ගේ ආයුධ ශක්තිය ප්‍රබල වීම

**මෙවැනි කරුණු දෙකක් පැහැදිලි කිරීමට** (ලකුණු 02+03 = 05 යි)

(iv)
- **ආර්ථික**
  - පාරිභෝගික කෘෂිකර්මය පිරිහීම
  - ආනයන-අපනයන ආර්ථිකයකට යොමුවීම
  - මුදල් හා බැංකු කටයුතු වර්ධනය
  - නව රැකියා බිහිවීම
  - යටිතල පහසුකම් දියුණුවීම

WWW.OLEVELAPI.COM

- **සමාජ**
  - දේශීය සංස්කෘතිය පිරිහී යාමට පටන් ගැනීම
  - මධ්‍යම පන්තිය බිහිවීම
  - ඉන්දීය ශ්‍රමිකයන්ගේ ආගමනය
  - ධනපති-කම්කරු පන්ති භේදය ඇතිවීම

**ක්ෂේත්‍ර දෙකෙන් වෙනස්කම් එක බැගින් විස්තර කිරීමට**

(ලකුණු 03+03 = 06 යි)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**06. නිපුණතාව :**

**බ්‍රිතාන්‍ය යුගයේදී ඇති වූ දේශපාලන සංස්කෘතික වෙනස් වීම් පිළිබඳ දැනුම හා නිදහසින් පසුව මෙරට ඇතිවූ අධ්‍යාපනික සංවර්ධනය පිළිබඳ තුළනාත්මකව විමසීමේ හැකියාව පිරික්සීම**

**6.** (i) පහත සඳහන් කාර්යයන් කවර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අනුව ක්‍රියාත්මක වූයේ දැයි දක්වන්න.

*A* - පැරණි ගම්සභාවේ බලතල උසාවිවලට පැවරීම

*B* - විධායක කාරක සභා ක්‍රමය ඇරඹීම

*C* - උත්තර මන්ත්‍රී මණ්ඩලය (සෙනෙට් සභාව) ස්ථාපිත කිරීම

(ii) පහත *A, B, C* හා *D* වලින් දක්වා ඇති තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන් දැයි දක්වන්න.

*A* - ලංකා සමසමාජ පක්ෂයේ ආරම්භක නායකයා

*B* - නිදහස් ශ්‍රී ලංකාවේ පළමු අගමැති

*C* - නිදහස් අධ්‍යාපනයේ පියා

*D* - ශ්‍රී ලංකාවේ පළමු විධායක ජනාධිපති

(iii) නිදහසින් පසු මෙරට අධ්‍යාපන සංවර්ධනය සඳහා ගත් ක්‍රියාමාර්ග **දෙකක්** පැහැදිලි කරන්න.

(iv) පහත නම් සඳහන් අයගෙන් **දෙදෙනකු** තෝරාගෙන ඔවුන්ගෙන් ආගමික හා සංස්කෘතික පුනර්ජීවනයට සිදු වූ සේවාවන් විස්තර කරන්න.

*A* - අනගාරික ධර්මපාලතුමා

*B* - හික්කඩුවේ ශ්‍රී සුමංගල නා හිමි

*C* - පොන්නම්බලම් රාමනාදන් මහතා

*D* - ආරුමුග නාවලර්තුමා

*E* - එම්. සී. සිද්දි ලෙබ්බෙ මහතා

*F* - ටී. බී. ජයා මහතා

(i) A - කෝල්බෘක්/1833 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
B - ඩොනමෝර්/1931 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
C - සෝල්බරි/1947 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

**(ලකුණු 01×03 = 03 යි)**

(ii) A - ආචාර්ය එන්.එම්. පෙරේරා මහතා
B - ඩී.එස්. සේනානායක මහතා/මාහාමාන්‍ය ඩී.එස්. සේනානායක මහතා
C - ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා/සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා
D - ජේ.ආර්. ජයවර්ධන මහතා

**(ලකුණු 01×04 = 04 යි)**

WWW.OLEVELAPI.COM

(iii)
- අධ්‍යාපනය ස්වභාෂාවෙන් ලබාදීම
- දිවා ආහාරය නැවත ලබාදීම
- ශිෂ්‍යත්ව ලබාදීම ක්‍රමවත් කිරීම
- විද්‍යාගාර පහසුකම්
- විශ්ව විද්‍යාල පහසුකම් දියුණු කිරීම
- ආධාර ලබන පාසල්/ගුරු විද්‍යාල රජයට පවරා ගැනීම
- අධ්‍යාපන පරිපාලනය සංවිධානය කිරීම
- පෙළපොත් හා නිල ඇඳුම් නොමිලේ ලබාදීම

**මෙවැනි ක්‍රියාමාර්ග දෙකක් පැහැදිලි කිරීමට** **(ලකුණු 02+03 = 05 යි)**



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(iv)

A • අනගාරික ධර්මපාලතුමා

- සිංහල බෞද්ධයන් තුළ ජාතික අභිමානයක් ඇති කිරීමට කටයුතු කිරීම
- මහා බෝධි සමාගම පිහිටුවීම
- බෞද්ධ පාසැල් පිහිටුවීමට දායක වීම
- බුද්ධගයාව බේරා ගැනීමට කටයුතු කිරීම

B • හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි

- මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන පිහිටුවීම
- සම්භාව්‍ය සිංහල කෘති සංස්කරණය/පරිවර්තනය කිරීම
  උදා :- මහාවංශය
- ශබ්ද කෝෂයක් නිර්මාණය

C • පොන්නම්බලම් රාමනාදන් මහතා

- හින්දු ආගමික පුනර්ජීවයක් ඇති කිරීමට මූලික වීම
- සිංහල දෙමළ සමගිය ඇති කිරීමට කටයුතු කිරීම
- යාපනයේ පරමේශ්වර විද්‍යාලය හා රාමනාදන් විද්‍යාලය පිහිටුවීමට මුල්වීම

D • ආරුමුග නාවලර්තුමා

- හින්දු පුනර්ජීවන ව්‍යාපාරයේ නායකත්වය ගැනීම
- යාපනයේ වන්නාර් පන්නෙයි ඉංග්‍රීසි විද්‍යාලය පටන් ගැනීම
- බයිබලය දෙමළට පරිවර්තනය කිරීම (පර්සිවල් දේවගැතිවරයා සමග)
- 1853 ශෛව පරිපාලන සභාව සහ හින්දු අධ්‍යාපන සභාව පිහිටු වීම

E • එම්.සී. සිද්දි ලෙබ්බේ මහතා

- ඉස්ලාම් සංස්කෘතික ප්‍රබෝධයක් ඇති කිරීමට කටයුතු කිරීම
- අරාබි හා ඉංග්‍රීසි ඉගෙනීමට තම ජනතාව උනන්දු කරවීම
- මද්රාසා විද්‍යාල ප්‍රතිසංවිධානය කිරීම
- මරදානේ සහිරා විද්‍යාලය ඇරඹීම
- ඥානදීපම්, මුස්ලිම් නේෂන් පුවත්පත් ඇරඹීම

F • ටී.බී. ජයා මහතා

- " සීලෝන් මුස්ලිම් රිව්ව් " සඟරාව තුළින් අධ්‍යාපනය කෙරෙහි මුස්ලිම් ජනතාව උනන්දු කිරීම
- සහිරා විද්‍යාලයේ විදුහල්පති ලෙස කටයුතු කිරීම
- ශ්‍රී ලංකාවේ ප්‍රථම පාර්ලිමේන්තුවේ කම්කරු ඇමතිවරයා ලෙස කටයුතු කිරීම

**මින් දෙදෙනෙකුගේ සේවාවන් විස්තර කිරීමට** **(ලකුණු 03+03 = 06 යි)**



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

## III කොටස

07. **නිපුණතාව :**

**වෛදික යුගයේ සිට ගුප්ත යුගය දක්වා ඉන්දියානු ආගමික හා සංස්කෘතික අභිවර්ධනය පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම**

**7.** (i) පහත *A, B* හා *C* වලින් දක්වා ඇති එක් එක් කරුණට අදාළ පිළිතුර අනුපිළිවෙළින් ලියා දක්වන්න.

*A* - ආර්යාගමනයට පෙර ඉන්දියාවේ වයඹදිග ප්‍රදේශයේ ව්‍යාප්තව තිබූ ශිෂ්ටාචාරය

*B* - ආර්යයන් ඉන්දියාවට සංක්‍රමණය වීමට භාවිත කළ ප්‍රධාන දුර්ග මාර්ගය

*C* - 'සප්ත සින්දු' ප්‍රදේශයේ වර්තමාන නම

(ii) *A* - වෛදික ග්‍රන්ථ **දෙකක්** ද

*B* - වෛදික යුගයේ අදහනු ලැබූ දෙවිවරුන් **දෙදෙනකු** ද නම් කරන්න.

(iii) අශෝක අධිරාජයාගේ ආගමික සේවාව කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න.

(iv) ගුප්ත යුගයේ දී අධ්‍යාපනය, සාහිත්‍යය හා කලාව යන ක්ෂේත්‍රවල ඇති වූ දියුණුව පැහැදිලි කරන්න.

(i) A - ඉන්දු නදී/මොහොන්දජාරෝ-හරප්පා

B - ඛයිබර්

C - පංජාබ්

**(ලකුණු 01×03 = 03 යි)**

(ii) A - සෘග්, යජුර්, සාම, අථර්වන්

B - ඉන්ද්‍ර, වරුණ, අග්නි, යම, පෘථිවි

**(ලකුණු 02+02 = 04 යි)**

(iii)
- තුන්වන ධර්ම සංගායනාවට අනුග්‍රහ දැක්වීම
- ධර්ම දූත සේවාව
- වෙනත් ආගම්වලට අනුග්‍රහ දැක්වීම
- වෙහෙර විහාර කරවීම
- ධර්ම මහා මාත්‍රවරුන් පත් කිරීම

**මෙවැනි කරුණු දෙකක් ඇසුරින් විස්තර කිරීමට** **(ලකුණු 02+03 = 05 යි)**

(iv)
- **අධ්‍යාපනය**
  - දියුණු විශ්ව විද්‍යාල පැවතීම (නාලන්දා, වලභි)
  - පුළුල් විෂය මාලාවක් පැවතීම
  - ගුරු ගෙදර කේන්ද්‍ර කරගත් හා බෞද්ධ ආරාමික අධ්‍යාපනයක් තිබීම

- **සාහිත්‍ය හා කලාව**
  - සංස්කෘත සාහිත්‍යය දියුණු වීම
  - උසස් සාහිත්‍ය කෘති බිහිවීම (සකුන්තලා, මේඝදූත ආදී)
  - "නවරත්න" නමින් හැඳින්වූ පඬිවරුන් සිටීම
  - මථුරා පිළිම කලාව
  - හින්දු දේව ප්‍රතිමා
  - අජන්තා එල්ලෝරා චිත්‍ර කැටයම්

**ඉහත ක්ෂේත්‍රවල ඇතිවූ දියුණුව පැහැදිලි කිරීමට**

**(ලකුණු 03+03 = 06 යි)**



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

08. **නිපුණතාව :**

**බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ ඉන්දීය ජනනායකයන්ගේ ක්‍රියාකලාපය හා බ්‍රිතාන්‍ය යටත් විජිත ප්‍රතිපත්තිය පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම**

**8.** (i) *A* - 'කල්කටාවේ ඉන්දියානු සංවිධානය' පිහිටුවීම
*B* - 'ඉන්දියානු ජාතික එකමුතුව' ආරම්භ කිරීම
*C* - ඉන්දියාවේ මුස්ලිම්වරුන්ට වෙනම රාජ්‍යයක අවශ්‍යතාව මුලින් ම පෙන්වාදීම

යන කරුණුවලට සම්බන්ධ පුද්ගලයන් කවුරුන් දැයි වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් දක්වන්න.
(මහත්මා ගාන්ධි, මොහොමඩ් ඉක්බාල්, මොහොමඩ් අලි ජින්නා, ඇලන් ඔක්ටේවියන් හියුම්, කර්සන් සාමි, සුරේන්ද්‍රනාත් බැනර්ජි)

(ii) ඉන්දියානු ජාතික කොංග්‍රසයේ මූලික අරමුණු **දෙකක්** දක්වන්න.

(iii) ක්‍රි.ව. 1857 ඉන්දියානු කැරැල්ලට ආසන්නතම හේතුව සඳහන් කොට එම කැරැල්ල අසාර්ථක වීමට බලපෑ හේතු **තුනක්** සඳහන් කරන්න.

(iv) ක්‍රි.ව. 1947 දී ඉන්දියාව දෙකඩ වීමට බ්‍රිතාන්‍යයන් විසින් අනුගමනය කළ ප්‍රතිපත්ති හේතු වූ ආකාරය කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

(i) A - සුරේන්ද්‍රනාත් බැනර්ජි
B - ඇලන් ඔක්ටේවියන් හියුම්
C - මොහොමඩ් ඉක්බාල්

(ලකුණු 01×03 = 03 යි)

(ii)
- ඉන්දියානුවන් තුළ දේශාභිමානය ඇති කිරීම
- රටේ මහජන මතය සංවිධානය කිරීම
- කුලය, ආගම, ප්‍රදේශය ගැන නොසලකා ජාතික හැඟීම් වර්ධනය කිරීම
- පොදු ජාතික ඉල්ලීම් බ්‍රිතාන්‍යයන් වෙත ඉදිරිපත් කිරීම

(ලකුණු 02×02 = 04 යි)

(iii) **ආසන්න හේතුව**

- ග්‍රීස් තැවරූ පතරොම් පිළිබඳ සිද්ධිය (ල. 02)

**අසාර්ථ වීමට හේතු**

- සැලැස්මක් නොමැති වීම
- කාර්යක්ෂම නායකත්වයක් නොමැති වීම
- ප්‍රභූ සහය නොලැබීම
- බ්‍රිතාන්‍ය හමුදා ශක්තිය
- පොදු අරමුණක් නොමැති වීම

| | | |
|---|---|---|
| ආසන්න හේතුවට | ලකුණු 02 | (ලකුණු 05 යි) |
| කරුණු තුනට | ලකුණු 03 | |



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(iv) බ්‍රිතාන්‍යයන් හින්දු මුස්ලිම් භේදය ඇති කිරීම සඳහා බෙදා වෙන් කර පාලනය කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කරන ලදී. මේ අනුව

- 1906 දී බෙංගාලය දෙකඩ කිරීම
- 1906 දීම මුස්ලිම් ලීගය පිහිටුවීමට මුස්ලිම් ජන නායකයන් උනන්දු කරවීම

**මෙවැනි කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කිරීමට** (ලකුණු 03+03 = 06 යි)

09. **නිපුණතාව :**

**යුරෝපීය බලව්‍යාප්තිය පිළිබඳ දැනුම හා අවබෝධය විමර්ශනාත්මකව පිරික්සීම**

**9.** (i) යුරෝපයේ මුලින් ම බිහි වූ ජාතික රාජ්‍ය **තුනක්** නම් කරන්න.

(ii) පහත *A, B, C* හා *D* වලින් දැක්වෙන තොරතුරුවලට අදාළ පුද්ගලයන් වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.

*A* - බටහිර ඉන්දියා දූපත් සොයා ගැනීම

*B* - පළමුවරට අප්‍රිකාවේ දකුණු තුඩුවට යාත්‍රා කිරීම

*C* - පිලිපීන් දූපත් සොයා ගැනීම

*D* - ගුරුත්වාකර්ෂණ නියමය සොයා ගැනීම

(සර් අයිසෙක් නිව්ටන්, ගැලීලියෝ ගැලිලි, ක්‍රිස්ටෝපර් කොළොම්බස්, වස්කෝ ද ගාමා, බර්තොලමියු ඩයස්, මැගලන්, නාවුක හෙන්රි, ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදා)

(iii) ජාතික රාජ්‍යයක ලක්ෂණ **තුනක්** විස්තර කරන්න.

(iv) *A* - ස්පාඤ්ඤ ජාතිකයන් ඇමෙරිකානු ප්‍රදේශවල ද

*B* - පෘතුගීසි ජාතිකයන් පෙරදිග ප්‍රදේශවල ද

බලය ව්‍යාප්ත කිරීමේ දී අනුගමනය කළ ක්‍රියාමාර්ග **එක** බැගින් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(i) එංගලන්තය, ස්පාඤ්ඤය, ප්‍රංශය, ඕලන්දය, පෘතුගාලය

(ලකුණු 01×03 = 03 යි)

(ii) A - ක්‍රිස්ටෝපර් කොළොම්බස්
B - බර්තොලමියු ඩයස්
C - මැගලන්
D - සර් අයිසෙක් නිව්ටන්

(ලකුණු 01×04 = 04 යි)

(iii)
- පාලන බලය රජු වෙත කේන්ද්‍ර ගතවීම
- රජුට ස්ථිර හමුදාවක් තිබීම
- නව සමාජ පන්ති බිහිවීම
- පොදු නීති පද්ධතියක් හා පොදු බදු ප්‍රතිපත්තියක් පැවතීම
- නව නිලධාරී පන්තියක ආරම්භය හා වර්ධනය

(10 පෙළ පොත, 72 පිටුව)

**මෙවැනි කරුණු තුනක් විස්තර කිරීමට** (ලකුණු 03+02 = 05 යි)

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(iv)

A • මූලික වශයෙන් කෲර මර්දනකාරී ක්‍රියා මාර්ග අනුගමනය

• පැරණි ශිෂ්ටාචාර විනාශ කොට සම්පත් කොල්ලකෑම

(උදා :- මැක්සිකෝ හා පීරුවල පැවති පැරණි ශිෂ්ටාචාර)

B • වෙළඳ ගබඩා, බලකොටු ඉදි කරමින් බලය ව්‍යාප්ත කිරීම

• මිත්‍ර ශීලීව කටයුතු කිරීම

• ගිවිසුම් මගින්

• යුධ ආධාර දීමෙන්

• ආගම් ප්‍රචාරය මගින්

**ක්‍රියාමාර්ග එක බැගින් විස්තර කිරීමට** (ලකුණු 03+03 = 06 යි)

10. **නිපුණතාව :**

**ලෝක සංග්‍රාම වලට පසුබිම් වූ හේතු හා ඒවායින් ලැබූ ප්‍රතිඵල ලෙස තුළනාත්මකව පිරික්සීම**

**10.** (i) පළමුවැනි ලෝක මහා සංග්‍රාමයට

*A* - බලපෑ ආසන්නතම හේතුව

*B* - සම්බන්ධ වූ ජර්මන් පාලකයාගේ නම

*C* - ඇමෙරිකා එක්සත් ජනපදය සම්බන්ධවීමට බලපෑ හේතුව ද

ලියා දක්වන්න.

(ii) දෙවැනි ලෝක මහා සංග්‍රාමයේ දී

*A* - මිත්‍ර පක්ෂයට නායකත්වය දුන් බ්‍රිතාන්‍ය අගමැති

*B* - හිට්ලර්ගේ කෲර වධ හිංසාවලට ලක් වූ ජනවර්ගය

*C* - ජපනුන් අල්ලාගත් පෙරදිග මිත්‍ර පක්ෂයේ ප්‍රධාන ආරක්ෂක මධ්‍යස්ථානය

*D* - ඉතාලිය යුද්ධයට මෙහෙය වූ එහි ෆැසිස්ට් නායකයා

වරහන් තුළින් තෝරා *A, B, C* හා *D* අනුපිළිවෙළින් ලියා දක්වන්න.

(හිරෝහිතෝ අධිරාජයා, මුසෝලිනී, යුදෙව්, ස්ලාව්, සිංගප්පූරුව, කල්කටා, වින්ස්ටන් චර්චිල්, ක්ලෙමන්ට් ඇට්ලි)

(iii) දෙවැනි ලෝක මහා සංග්‍රාමය මෙතෙක් ලොව ඇති වූ දරුණුතම ව්‍යසනය බව කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

(iv) දෙවැනි ලෝක මහා සංග්‍රාමයෙන් පසුව ලෝක දේශපාලනයේ ඇති වූ වෙනස්කම් **තුනක්** විස්තර කරන්න.

WWW.OLEVELAPI.COM

(i) A - සරයේවෝ සිද්ධිය

B - දෙවන විලියම් කයිසර්

C - ලුසිටානියා නැව ගිල්වීම

(ලකුණු 01×03 = 03 යි)

(ii) A - වින්ස්ටන් චර්චිල්

B - යුදෙව්

C - සිංගප්පූරුව

D - මුසෝලිනි

(ලකුණු 01×04 = 04 යි)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(iii) • අති මහත් ජීවිත විනාශය
- දේපල විනාශය
- ලක්ෂ සංඛ්‍යාත ජන සංඛ්‍යාවක් අවතැන් වීම
- න්‍යෂ්ටික බෝම්බ භාවිතය
- පරිසර දූෂණය හා විනාශය

[illegible]

**කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කිරීමට** **(ලකුණු 02+03 = 05 යි)**

(iv) • යටතේ විජිතයන්ට නිදහස ලැබීම
- පැරණි අධිරාජ්‍යවාදී රටවල බලය හීනවී යාම (බ්‍රිතාන්‍ය, ප්‍රංශය)
- ලෝකය බල කඳවුරු දෙකකට බෙදීම ( [illegible]
- ජර්මනිය දෙකඩ වීම
- නව රාජ්‍ය බිහිවීම (ඊශ්‍රායලය, යුගෝස්ලේවියාව) [illegible]
- එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහිවීම

[illegible]

**වෙනස්කම් තුනක් විස්තර කිරීමට** **(ලකුණු 03+03 = 06 යි)**

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...